# 8

# සලාතයේ වැදගත්කම

පවුලේ මජ්ලිසය යන නමින් වසීම්ගේ පියා ගෙදර පන්තියක් පවත්වා ගෙන ගියේ ය. එය ආරම්භ වන්නේ ඉෂා සලාතයෙන් පසු ව ය. එයට අම්මා, තාත්තා, වසීම්ගේ සහෝදරයින් වන හාතිම්, අර්ෆකාන් සහ සොයුරියන් වන රිෂා සහ සබ්රා යන සියල්ලෝ ම සහභාගි වෙති. එදින ද ෆාතිහා පාරායනයෙන් මජ්ලිසය ආරම්භ කෙරිණි.

**තාත්තා:** පසුගිය මාසයේ 'ඉබාදත් කිරීමට සූදානම් වෙමු' යන මාතෘකාවෙන් වුලූඃ කිරීම ගැන ඉගෙන ගත්තා. අද ඉන්ෂා අල්ලාහ් සලාතයේ වැදගත්කම ගැන සොයා බලමු.

**ආච්චි:** පුතේ, ඒක හොඳ මාතෘකාවක්. අද කාලේ ළමයි ටියුෂන් පන්ති, ක්‍රීඩා තරග, චාරිකා කියලා සලාතය අතහැර දමනවා. ඒක සාමාන්‍ය දෙයක් වෙලා.

**තාත්තා:** ඒක තමයි. ඉස්සර වගේ නොවේ. දැන් පාසල්වල සලාතය ගැන අවධාරණය කෙරෙන්නෙ අඩුවෙන්.





**වසීම්:** තාත්තේ පාසලේ පවත්වන විවිධ උත්සව අවස්ථාවල දී සලාතය ගැන එච්චර තැකීමක් නෑ කියා මෞලවි සර් දුක්වෙනවා, දකින්න පුළුවන් .

**තාත්තා:** ශිෂ්‍ය ජීවිත කාලයේ දී එයාලා මරණය ගැන හිතන්නේ අඩුවෙන්. ඒකයි සලාතය ගැන සැලකිල්ලක් නොදක්වන්නේ. ඒත් කියාමාවේ දී ප්‍රථමයෙන් ප්‍රශ්න කරන්නේ සලාතය ගැන කියල හදීස් තිබෙනවා. ඒක ඒ අයට අවධාරණය කරන්න ඕනෑ.

**රිෂා:** ආච්චි කිව්වා වගේ ටියුෂන් පන්ති, ක්‍රීඩා උත්සව, චාරිකා ගැන කියලා සලාතය ගැන නොසැලකිලිමත් වුණා නම් කියාමාවේ දි ප්‍රශ්න කිරීමේ දී අහුවෙනවා. ඊට පස්සේ අනික් ප්‍රශ්නවලදී බේරෙන්න බැරි වෙයි.

**අම්මා:** මුලින් වෙච්ච ඇදය දිගට ම ඇදයක් වගේ ම පවතිනවා ලු.

**තාත්තා:** ඔව්, රිෂා කිව්ව වගේ සලාතය විධිමත් නොවූවානම් කියාමා කරුණු පමණක් නොව මෙලොව ජීවිතයේ අනික් කරුණුත් පිළිවෙළක් වෙන්නේ නෑ.

**අර්ෆකාන්:** තාත්තේ, අයකු ඉස්ලාමය වැලඳගත්තා නම් ඊළඟ මොහොතේ ම ඔහුට සලාතය අනිවාර්ය වෙනවා, නේ ද?

**තාත්තා:** ඔව් සලාතය එතරම් දුරට අනිවාර්ය කරලයි තියෙන්නේ. සෑම දෙනා ම සලාතය ඉටු කළ යුතු ෆර්ල් අයින් වූ වගකීමක්.

**ආච්චි:** මේ රජබ් මාසයයි. මේ මාසයේ දී ඉස්රා, මිහ්රාජ් සිද්ධිය සිදුවුණා. මිහ්රාජ් ගමනේ දී අහස් හතකට ඉහළ දී සලාතය අනිවාර්ය කළා. මේ අනුව සලාතය කෙතරම් උසස් ද කියා වැටහුණා නේ ද?

**ෆාතිමා:** තාත්තා, ආච්චි කිව්වා වගේ සලාතය වැදගත් නිසා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා තම මරණ මංචකයේ දී පවා සලාතය අවධාරණය කළා යැයි අපගේ ගුරුතුමිය පැවසුවා.

**තාත්තා:** දුව, යුදපිටියේ සටන් කරන අවස්ථාවේ පවා සලාතය අතහැර

දැමීමට ඉස්ලාම් අවසර දී නෑ. ඒ නිසා යුද පිටියේ යුද්ධ කරන අවස්ථාවේත් සලාතය ඉටු කළ යුතු ආකාරය විස්තරාත්මක ව කියා තිබෙනවා.

**හාතිම්** දේව භක්තිය යහගැත්තන්ගේ විශේෂ ලක්ෂණයක් බව අල්කුර්ආන් පවසනවා. සූරා මුඃමින්හි ප්‍රථම වැකි දහයෙහි සඳහන් වන ජය ලබා ගන්නා විශ්වාසවන්තයින්ගේ ලක්ෂණ අතර ස්ථාන දෙකක සලාතය ගැන සඳහන් වෙනවා නේ ද?

**තාත්තා** ඔව් හාතිම්, එම වචනවල මුල දී සලාතය වටහා ගෙන අවබෝධ කර බිය බැතියෙන් යුක්ත ව ඉටු කළ යුතු බව සඳහන් වෙනවා. සූරා මුඃමින්හි වැකි සලාතය අඛණ්ඩ ව දිගට ම ඉටු කළයුතු බව අවධාරණය කෙරෙනවා. මෙම කරුණු සලාතය ඉටු කරන විට නොපිළිපදින විට එය නොසැලැකිල්ල සේ සැලැකෙනවා. සලාතය දෙවියන් වෙනුවෙන් නො ව අන් අය වෙනුවෙන් ඉටු කිරීම ව්‍යාජ ක්‍රියාවකි. ව්‍යාජ ක්‍රියා එක්තරා ආකාරයක ෂිර්කයකි. මේ අනුව සලාතය ඉටු කරන පුද්ගලයින් නිරයට යන බව සූරා මාඌන්හි දැක්වෙනවා.

**ෆාතිමා:** සලාතය නිසි වේලාවට ඉටු නොකරන්නන්ගේ තත්ත්වය ?

**තාත්තා:** ඇත්තෙන් ම සලාතය විශ්වාසවන්තයින් මත වේලාව සඳහන් වූවක් බව අල්කුර්ආනයේ සඳහන් වෙනවා. සලාතය නිසි වේලාවට ඉටු කිරීමෙන් මෙලොව හා පරලොව අසීමිත කුසල ලබා දෙනවා.

**අර්ෆකාන්:** නිසි වේලාවට සලාතය ඉටු කරන නිසා අපට කාල කළමනාකරණ පුහුණුවක් ලැබෙන බව පන්තියේ දී මෞලවි ගුරුතුමා පැවසුවා.

**තාත්තා:** ඔයා හරි, අම්මාර් නියම වේලාවට සලාත ඉටු කිරීමට පුරුදු වුණාම ජීවිතයේ අනෙක් අවස්ථාවල දී ද සිය කාර්යය වෙලාවට ඉටු කරන පුරුද්ද ඇතිවෙනවා. ඒ සඳහා එක ම ක්‍රමය පස්වේල් සලාතය මස්ජිදයට ගොස් ජමාඅත් ලෙස ඉටු කිරීමයි.

**හාතිම්:** තාත්තේ! තනි ව සලාතය ඉටු කරනවාට වඩා ජමාඅත් වශයෙන් සලාතය ඉටු කිරීම 27 ගුණයක් සුවිශේෂී යැයි නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා කියා තිබෙනවා.

**තාත්තා:** ජමාඅත් ලෙස සලාතය ඉටු කිරීමෙන් විධිමත් ලෙස ජීවත් වීමේ පුහුණුව ලැබෙනවා. එයින් අප අතර සහෝදරකම, අන්‍යෝන්‍ය සෙනෙහස හා සමාජ හැඟීම, නායකත්වයට ගරු කිරීම, සහයෝගයෙන් ක්‍රියාකිරීම වැනි හොඳ පුරුදු ඇතිවෙනවා.

**අම්මා:** සලාතය ඉටු කිරිම මගින් රිzස්ක්හි බරකතය ඇති වෙනවා, හිතට සැනසුම ලැබෙනවා, මුහුණේ දීප්තියක් ඇති වෙනවා.

**අර්ෆකාන්:** සලාතය හොඳ ශාරීරික අභ්‍යාසයක්. සිරුරට උද්යෝගීමත් බවක් ඇති වෙනවා. සුබ්හ් සලාතය ඉටු නොකරන අයගේ මුහුණු ෂෙයිතාන් කැත කරන බවත්, එනිසා අදාළ පුද්ගලයා එදින මැළවුණු ස්වභාවයෙන් සිටින බවත් නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා පවසා තියෙනවා.

**තාත්තා:** එපමණක් නො වෙයි සුබ්හ් සලාතය ජමාඅතය සමඟ ඉටු කරන අයෙක් එදින අල්ලාහ්ගේ ආරක්ෂාව යටතට පත්



වෙන බවත් නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා පවසා තියනවා. තව ද සලාතය ලැජ්ජා සහිත ක්‍රියාවන්ගෙන් හා නරක කාර්යයන්ගෙන් (සලාතය ඉටු කරන්නන්) වළක්වන බව ද අල් කුර්ආනය පවසනවා. සලාතය ඉටුකරන අප අවිධිමත් හා අශිෂ්ට ක්‍රියාවලින් වැළකී සිටිය යුතු යැයි ද මෙම වැකියෙන් අවධාරණය කෙරෙනවා.

මේ ආකාරයෙන් මස්ජිදයේ පාවහන් අවිධිමත් ලෙස තැබීම, මාර්ග නීති රීති නො පිළිගෙන ක්‍රියා කිරීම, පාසල්වල අසංවිධිත ලෙස හැසිරීම, නිවසේ දේවල් ඒ ඒ තැන්වල නොතැබීම නොහොබිනා ඇඳුම් ඇඳීම වැනි කරුණුවලින් අපව වළක්වනවා. එසේ ම සමාජයේ දක්නට ඇති දුප්පත්කම, දුගී බව, නොදැනුවත්කම, අක්‍රමිකතාව, සංස්කෘතියට පටහැනි බව, අසාධාරණය, අයුක්තිය ආදියට විරුද්ධව සටන් කිරීමේ අධිෂ්ඨානය ආදිය සලාතය මගින් අපට ලබා දෙනවා. මෙලෙස අපි බැතිබියෙන් යුක්ත ව අල්ලාහ් කෙරෙහි ඇති සෙනෙහෙ බැතියෙන් සලාතය ඉටු කළ යුතු ය. එවිට සලාතය පිළිගත් එකක් වේවි. එම නිසා සලාතය කෙරෙහි අධික ලෙස සැලකිල්ලක් දක්වා සලාතය ඉටු කරමු. අස්සලාමු අලයික්කුම්!

**සියල්ලන් ම:** ව අලයිකුමුස්සලාම් වරහ්මතුල්ලාහි වබරකාතුහු.

## අභ්‍යාසය

කෙටි පිළිතුරු සපයන්න.

1. කියාමාවේ දී ප්‍රථමයෙන් විමර්ශනය කරන්නේ කුමන අමල් ද?
2. සලාතය කුමන අවස්ථාවක දී අනිවාර්ය කරනු ලැබුවේ ද?
3. ප්‍රථම ඇදවීම සියල්ල ම ඇදවීම යැයි රිෂාගේ කතාව විස්තර කරන්න.
4. අන් අයට පෙන්වීමට සලාතය ඉටුකරන්නන්ගේ තත්ත්වය කෙසේ වේ ද?
5. සලාතය මගින් අත්වන ප්‍රයෝජන 3ක් ලියන්න.